පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.03.30 පැය 0935 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 607 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. පහරදී තුවාල සිදු කිරීමකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - කෑගල්ල පොලිස් ස්ථානය.**

2025.03.28 වන දින දහවල් කාලයේ කෑගල්ල මහ රෝහල ඉදිරිපිටදී පුද්ගලික ආරවුලක් මත කෑගල්ල රෝහලේ විශේෂඥ වෛද්‍යවරයෙකුට පහරදීමක් සම්බන්ධයෙන් කෑගල්ල පොලිසිය මඟින් විමශර්න ආරම්භ කරන ලද අතර පහරදීමට සම්බන්ධ සැකකරු එදිනම කෑගල්ල පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන මහනුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාල ලැබූ වෛද්‍යවරයා මේ වන විට කෑගල්ල රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන අතර අත්අඩංගුවට ගත් සැකකරු කෑගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2025.04.04 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.

කෑගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාතර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.03.29 වන දින දහවල් කාලයේ මාතර පොලිස් වසමේ රොටුබවත්ත ප්‍රදේශයේදී මාතර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 100 ක් හා අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 400 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අයිස් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට යොදාගත් උපකරණ ද සමඟ** අත්අඩංගුවට ගෙන මාතර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 වයසේ පසු වන** මාලිම්බඩ **ප්‍රදේශයේ පදිංචි වෛද්‍යවරයෙක් හා තෙලිජ්ජවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපළ ඒකකය.**

2025.03.30 වන අද දින අළුයම් කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශයේ ගුවන්තොටුපළ ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත

ගුවන්තොටුපල පැමිණීමේ පයර්න්තයේදී වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස විදේශීය දුම්වැටි 20000 ක් (කාටුන් 100 ක් ) ඩුබායි සිට මෙරටට ගුවන් මඟින් රැගෙන එන ලද පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන අකුරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**